// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2117/25 – 2019 අප්‍රේල් 03 වැනි බදාදා – 2019.04.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/COM/04/2017/54-i
IR/COM/04/2017/219

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව -

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ජයන්ත තිරාණගම ඇතුළු සේවක පිරිස, දනවල, නෙළුව.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

තේ ශක්ති අරමුදල, 8 වන මහල, සෙත්සිරිපාය, ii වන අදියර, බත්තරමුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා

1A – G 29804 – 11 (2019/04)
*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතලේ, මේල්පිටිය, අංක. 75, එස්. කාරියවසම් මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවින්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 මාර්තු මස 26 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2017/54-i
IR/COM/04/2017/219

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ජයන්ත තිරාණගම ඇතුළු සේවක පිරිස, දනවල, නෙළුව.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

තේ ශක්ති අරමුදල, 8 වන මහල, සෙත්සිරිපාය, ii වන අදියර, බත්තරමුල්ල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

"තේ ශක්ති අරමුදල සතු කම්හල් වසා දැමීමේ හේතුව මත තේ ශක්ති අරමුදලේ සේවය කළ ජයන්ත තිරාණගම මයා ඇතුළු පහත නම් සඳහන් සේවකයින් 08 දෙනාගේ සේවය 2016.12.31 දින සිට අවසන් කිරීමේදී වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමට අවස්ථාව තිබියදී විශ්‍රාම යැවීමේ වයස අවුරුදු 55 ලෙස සලකා වන්දි ගණනය කිරීම මගින් අසාධාරණයක් සිදුවී තිබේද? එසේ සිදුවී තිබේ නම් ඔවුනට ලැබිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ."

01. ජයන්ත තිරාණගම
02. ඒ. ඩබ්. කුමාරසිරි
03. එම්. පී. නීතා රත්නකුමාරි
04. එම්. කේ. අනුර සරත් කුමාර
05. පසන් වටවල
06. ප්‍රියන්ත බාලපටබැඳි
07. ඩබ්. එම්. ධර්මසිරි
08. ඩබ්. ඩබ්. සී. සී. කුමාර

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මාර්තු මස 14 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

04 – 573

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.